**මීරිගම ප්‍රාදේශීය සභාව**
**ගම්පහ දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට මීරිගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර තිබූ අවම වටිනාකම් ගිණුමෙන් ඉවත්කර තිබුනද ස්ථාවර වත්කම් ගිණුම් තැබීමට අදාලව ගිණුම් ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි.

1.3.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) ඔප්පු අංක 268 මගින් 2016 ජූලි 29 දින ප්‍රාදේශීය සභාවට ලබා දී තිබූ වේවැල්දෙනිය පැලහිටිවත්ත කැලේ ඉඩමෙහි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) වේවැල්දෙනිය කාර්යාල ගොඩනැගිල්ලෙහි බිම සකස්කිරීම සහ මුරකුටිය ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල දරන ලද වියදම රු.2,102,395 ක් වුවද, ගිණුම්ගත කර තිබූ වටිනාකම රු.4,204,790 ක් වූ බැවින් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.2,102,395 කින් වැඩිපුර ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සෞඛ්‍ය කම්කරු හා රියදුරු විවේකාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල ගිණුම්ගත කළයුතු වටිනාකම රු.5,677,371 ක් වුවද ඉඩම් හා ගොඩනැගිලි ගිණුමට රු.3,792,380 ක් පමණක් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සභා භූමියෙහි කුට්ටිගල් ඇතිරීම සඳහා අදියර දෙකකදී වැයකල රු.2,037,849 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් සඳහා අදාල සියයට 10 රඳවුම් මුදල ප්‍රාග්ධනිත නොකිරීමෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.375,535 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2017 වර්ෂය තුල වෙන්දේසි කරන ලද වේවැල්දෙනිය හැපිලැන්ඩ් එස්ටේට් ඉඩමෙහි පොදු කොටසෙහි වටිනාකම තක්සේරුකර ගිණුම්ගත කර නොතිබුණි.

(උ) ණය පදනම මත ලබාදෙන ලද ට්‍රැක්ටර් හා ටේලර් වලට අදාල ණය ශේෂය රු.3,285,000 ක් උපයෝගීතා සේවා ගිණුමට හර කලයුතු වුවද එය සමුච්චිත අරමුදලට හර කර තිබුණි.

1.3.3 **නොසැසඳුණු ගිණුම්**

ගිණුම් විෂයයන් 04 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.6,368,665 ක වෙනසක් පැවතුණි.

1.3.4 **<u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>**

(අ) **<u>ලැබිය යුතු ගිණුම්</u>**

(i) රු.6,553,908 ක් වූ පෙර ගෙවුම් ශේෂය තුල වර්ෂ 05 ට වැඩි රු.6,059,371 ක් හා වසර 01 ත් 05 ත් අතර රු.475,269 ක් පැවතුණි.

(ii) පෞද්ගලික ආයතනයකට වැඩිපුර ගෙවා තිබූ අත්තිකාරම් රු.3,748,794 ක මුදල අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) වසර හතරකට වඩා කල්ඉකුත් වූ චෙක්පත් දහයකට අදාලව රු.6,708 ක අගරු චෙක්පත් ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු නොකර 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) **<u>ගෙවිය යුතු ගිණුම්</u>**

2017 දෙසැම්බර් 31 දිනට පැවති රු.68,314,633 ක් වූ ණයහිමි ශේෂය තුල වර්ෂ 02 ට වැඩි 03 ට අඩු රු.3,467,230 ක්, වර්ෂ 03 ට වැඩි 04 ට අඩු රු.266,044 ක් සහ වර්ෂ 4 ට වැඩි රු.2,860,797 ක් පැවතුණි.

1.3.5 **<u>විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම</u>**

**<u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>**

තැන්පතු ලේඛනය හා කාල විශ්ලේෂන ඉදිරිපත් නොකිරීම නිසා රු.8,833,248 ක් වූ මීරිගම උපකාර්යාලයේ ආපසු ගෙවියයුතු තැන්පතු ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකිවිය.

1.3.6 **<u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1971 අංක 48 දරන පළාත් පාලන ආයතන පිළිබඳ විශේෂ විධිවිධාන පනත | | වරිපනම් බදු තක්සේරුව වර්ෂ 05 කට වරක් තක්සේරු දෙපාර්තමේන්තුව ලවා කරවා ගත යුතු වුවද 2008 වර්ෂයෙන් පසු වරිපනම් තක්සේරු කර නොතිබුණි. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වගන්තිය | | සභා බල ප්‍රදේශයට අයත් මංමාවත්වල සැලැස්මවල් පිළියෙල කර ලේඛනයක් ගැසට් පත්‍රයක් මගින් පලකර සභා අයිතියට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තිය සහ පළාත් පාලන කොමසාරිස්ගේ 2008 අගෝස්තු 19 දිනැති අංක WP/LPD/10/2008 දරන චක්‍රලේඛයේ 4 (ආ) ඡේදය | | පළාත් පාලන ආයතන සඳහා උපරිම වරිපනම් බදු ප්‍රමාණයක් ලබා ගැනීම පිණිස හැකිතාක් දියුණු ගම් ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමට හැකි බල ප්‍රදේශ හඳුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 571 (2) — 4,569,824 — වර්ෂ 02 ක් ඉක්මවූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.19,448,237 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.27,520,603 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 වර්ෂය | | | | 2016 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 14,130,000 | 11,662,300 | 11,816,312 | 5,325,853 | 1,081,880 | 14,134,948 | 18,267,203 | 5,479,865 |
| කුලී | 15,895,000 | 14,999,735 | 14,547,328 | 1,131,046 | 13,768,000 | 12,469,850 | 12,536,535 | 678,639 |
| බලපත්‍ර ගාස්තු | 1,896,100 | 2,201,172 | 2,200,172 | 66,775 | 1,507,150 | 1,466,145 | 1,471,795 | 65,775 |
| වෙනත් ආදායම් | 240,000 | 666,768 | 509,290 | 157,478 | - | - | - | - |
| | 32,161,100 | 29,529,975 | 29,073,102 | 6,681,152 | 16,357,030 | 28,070,943 | 32,275,533 | 6,224,279 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට වරිපනම් හා බදු හිඟ ශේෂය රු.5,325,853 ක් හා කුලී හිඟ ශේෂය රු.1,131,046 වූ අතර වර්ෂය තුල එම හිඟ ශේෂයන් අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

#### 2.2.3 වරිපනම්

(අ) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් කාල විශ්ලේෂණය අනුව , වසර 1 සිට 3 දක්වා රු.1,611,647 ක්, වසර 03 සිට 05 දක්වා රු.586,670 ක්, වසර 5 සිට වසර 10 දක්වා රු.633,326 ක් හා වසර 10 ට වැඩි රු.2,099,040 ක් සභාවට අයකර ගත යුතුව පැවතුණි.

(ආ) වටිනාකම අනුව සභාවට අයවිය යුතු හිඟ වරිපනම් ශේෂ හා ඒකක ගණන පහත දැක්වේ.

| වටිනාකම | වරිපනම් ඒකක ගණන | හිඟ ශේෂය |
|---|---|---|
| රු. | | රු. |
| 10,000 ට අඩු | 3,595 | 2,813,433 |
| 10,000 – 50,000 | 33 | 212,455 |
| 50,000 ට වැඩි | 03 | 1,907,825 |
| එකතුව | -------- | ------------ |
| | 3,631 | 4,933,713 |
| | ==== | ======= |

2.2.4 **බලපත්‍ර ගාස්තු**

(අ) **වෙළඳ බලපත්‍ර**

2017 වර්ෂය වෙනුවෙන් වෙළඳ ආයතන 1219 ක් සඳහා බලපත්‍ර ලබා දීමට අයදුම් පත්‍ර මහජන සෞඛ්‍ය පරීක්ෂක කාර්යාලය වෙත යොමුකර තිබුණද, මින් අනුමත වී ආපසු ලැබී තිබුනේ අයදුම්පත්‍ර 1176 ක් පමණි.

(ආ) **කර්මාන්ත හා ව්‍යාපාර බදු**

(i) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන ) රීති අංක 07 හි 59 වගන්තිය ප්‍රකාරව , සෑම වර්ෂයක් ආරම්භයේදී සිදුකල යුතු කර්මාන්ත පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

(ii) 2017 දෙසැම්බර් 31 දිනට හිඟ කර්මාන්ත හා ව්‍යාපාර බදු ශේෂය වූ රු.117,758 තුල වේවැල්දෙනිය උප කාර්යාලයේ වසර 3-5 අතර ශේෂය රු.31,560 ක් හා පල්ලෙවෙල සහ මීරිගම උප කාර්යාල වල වර්ෂ 05 ට වැඩි ශේෂය රු.44,530 ක් විය.

2.2.5 **වෙනත් ආදායම්**

(අ) **ප්‍රචාරණ දැන්වීම්**

(i) 2015 දෙසැම්බර් 28 දිනැති අංක 1947 / 6 දරන අති විශේෂ ගැසට් පත්‍රය සහ 2016 අගෝස්තු 03 දිනැති අංක 1978 / 22 දරන (සංශෝධිත) බස්නාහිර පළාත් සභා ගැසට් පත්‍රය ප්‍රකාරව ප්‍රචාරණ දැන්වීම් සඳහා අනුමැතිය ලබාගැනීමේදී ඉදිරිපත් කලයුතු ලිපිලේඛන හෝ දැන්වීමෙහි ආකෘතියක් ඉදිරිපත් කර නොතිබියදී දැන්වීමෙහි ස්වභාවය හා ප්‍රදර්ශනය කරන කාලසීමාව පිළිබඳව සැලකිලිමත් නොවී මීරිගම උපකාර්යාලය විසින් දැන්වීම් පුවරු සඳහා ගාස්තු අයකර තිබුණි.

(ii) දැන්වීම් පුවරු ආදායම් පිළිබඳව විස්තර ඇතුලත් කර ලේඛනයක් මීරිගම උපකාර්යාලය විසින් පවත්වා ගෙන නොතිබුණි.

(iii) ප්‍රචාරණ දැන්වීම් ගාස්තු අයකල පසු දැන්වීම් පුවරුවෙහි ප්‍රාදේශීය සභාවෙහි නිල මුද්‍රාව යොදා නොතිබුණි.

(ආ) **සම්ප්‍රේෂණ කුළුණු**

ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල සම්ප්‍රේෂණ කුළුණු 64 ක් හදුනාගෙන තිබූ අතර 2009 අප්‍රේල් 17 දින අංක 1597/18 දරන අති විශේෂ ගැසට් පත්‍රය පාදක කර අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීම තුළින් ආදායම් එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1. <u>කාර්යසාධනය</u>

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණ කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>අතුරු ව්‍යවස්ථා</u>

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 12 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් 12 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඇ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(i) කසළ අවසන් බැහැර කරන ඉඩමට කසළ බැහැර කිරීම සඳහා පරිසර අනුමැතියක් තිබෙන බවට සාක්ෂි නොතිබුණි.

(ii) ප්‍රාදේශීය සභාව විසින් බැහැර කරනු ලබන කසළ, ඉඩම් හිමිකරු විසින් සෞඛ්‍ය ආරක්ෂිත ලෙස වසා දැමිය යුතු වුවද සභාවේ වාහන වලින් පස් ප්‍රවාහනය කර කුණු වසා දැමීම සහ සේවකයන් ලවා සිදුකිරීම නිසා ඒ සඳහා පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(iii) කසළ අවසන් බැහැර කල ටිපර් රථ ගණන පිළිබද සනාථ කර ගැනීමට ධාවන සටහන් මගින් නොහැකි විය.

(iv) බැහැර කරනු ලබන අපද්‍රව්‍ය නිශ්චිත මිනුම් ක්‍රමයක් භාවිතා කරමින් ඉටුකළ වැඩ පදනම් කරගෙන ගෙවීම් කිරිම වෙනුවට කාලය පදනම් කරගෙන ගෙවීම් කිරීමට ගිවිසුම් අත්සන් කර තිබුණි.

(ඈ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව ප්‍රාදේශීය සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුලින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 ජූනි 08 දින වන විටත් සකස්කර නොතිබුණි.

3.2 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය**

| ශ්‍රේණිය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 | - |
| තෘතීයික | 01 | 01 | |
| ද්විතියික | 46 | 42 | 05 |
| ප්‍රාථමික | 116 | 90 | 27 |
| අනියම්/ ආදේශක/ කොන්ත්‍රාත් / | - | 26 | - |
| 28-2014 ස්ථිර | 45 | 43 | |
| | ------ | ----- | ---- |
| | 210 | 204 | 32 |
| | === | === | === |

සෞඛ්‍ය පරිපාලක තනතුර 2009 වර්ෂයේ සිටද , ඖෂධ සංයෝජක තනතුර 2015 වර්ෂයේ සිටද, ආදායම් පරීක්ෂක තනතුරු දෙකක් 2006 වර්ෂයේ සිටද පුරප්පාඩුව පැවතීම නිසා සභාවේ කසළ කළමනාකරණයට, ආයුර්වේද ප්‍රතිකාර ලබාදීමේ කටයුතු සහ සභාවේ ආදායම් රැස්කිරීමේ කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට නොහැකි වී තිබුණි.

(ආ) **සේවක ණය**

විශ්‍රාම ගිය නිලධාරීන් 23 දෙනෙකුගෙන් රු.294,726 ක්, සේවය අත්හිටවූ නිලධාරීන්ගෙන් රු.195,945 ක් හා ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගෙන් රු.795,366 ක් පිළිවෙලින් අයවිය යුතුව තිබුණි.

3.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

(අ) **වරිපනම් අයකිරීම්**

වරිපනම් ඒකක 9266 න් 2017 වර්ෂයේ දී වරිපනම් අයකර තිබුනේ ඒකක 6515 කින් පමණි.

(ආ) **වෙන්දේසි ඉඩම්**

ඉඩම් කට්ටිකර විකිණීමේදී ප්‍රාදේශීය සභා පනතේ 154 (1) වගන්තිය අනුව එම ඉඩම් වල විකුණුම් වටිනාකම මත අයකල යුතු සියයට එකක බද්ද වෙනුවට 2017 වර්ෂය තුල විකුණන ලද ඉඩම් 06 කින් ආදායම් පරිපාලකගේ තක්සේරුව මත සියයට එකක බද්දක් අයකර තිබුණි.

(ඇ) **කඩකාමර බදුදීම**

මීරිගම උපකාර්යාලයට අයත් කඩකාමර 256 න් කඩකාමර 241 ක බදු ගිවිසුම් කාලසීමාව අවසන්ව තිබුනද සභාව විසින් ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) **මහජන පැමිණිලි**

ප්‍රාදේශිය සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් සභාව වෙත ලැබෙන මුළු පැමිණිලිවලින් නොවිසඳී ඇති පැමිණිලි කොපමණ ද යන්න නිරීක්ෂණය නොවුනි. මහජන පැමිණිලි පිළිබඳ ලේඛනයට ඇතුලත්ව තිබුනේ තීරණයකට අදාලව ලිපි තැපැල් කිරීම සිදුකරනු ලැබූ පැමිණිලි පමණක් වන අතර සභාව වෙත ලැබෙන සියළුම මහජන පැමිණිලි ලේඛනගතකර ගැනීමක් සිදුකර නොතිබුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

3.4.1 **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය**

(අ) 2017 දෙසැම්බර් 31 දිනට පුස්තකාල සමීක්ෂණ වාර්තාව අනුව අස්ථානගත වී තිබූ වටිනාකම රු.20,223 ක් වූ පොත් 95ක් සහ පාවිච්චියට ගත නොහැකි ඉවත්කල යුතු වටිනාකම රු.35,921 ක් වූ පොත් 331 ක් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කර නොතිබුණි.

(ඇ) සභාවට අයිතිය තිබෙන බව සඳහන් පොදු ඉඩම් කිහිපයක් සඳහා හිමිකම් ඔප්පු නොතිබුන අතර සභා අරමුදල් වලින් ඉදිකර ඇති පොදු ළිං කිහිපයක් සඳහා ද හිමිකම් ඔප්පු නොතිබුණි.

(ඈ) සභාව සතු පොදු ඉඩම්වල මායිම් නිවැරදි කර වෙන්කර සභාව සතු බවට පුවරු සවිකර නොතිබුණි.

3.4.2 **වාහන උපයෝජනය**

(අ) ප්‍රාදේශීය සභාව සතු රු.4,999,500 ක වටිනාකමැති බැකෝලෝඩර යන්ත්‍රයක් (හොලන්ඩ්) 2014 අප්‍රේල් 20 දින සිට අක්‍රියව පවතින අතර අළුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගැනීම නිසා ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ දිරාපත් වෙමින් තිබුණි.

(ආ) වටිනාකම රු.850,000 ක් වූ ට්‍රැක්ටරයක් 2016 නොවැම්බර් 25 දින සිට සහ රු.204,900 ක වටිනාකමැති ට්‍රැක්ටරයක් 2016 පෙබරවාරි 08 දින සිට ධාවනයෙන් ඉවත්කර තිබූ අතර 2018 අප්‍රේල් 25 වනවිටත් අළුත්වැඩියා කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනිමකින් තොරව ප්‍රාදේශීය සභා පරිශ්‍රය තුළ ගාල්කර තිබුණි.

3.5 **ප්‍රසම්පාදනය**

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

2006 ජනවාරි 25 දිනැති ජාතික ප්‍රසම්පාදන ඒජන්සි චක්‍රලේඛ අංක 8 හි 4.2.1 (බී) සහ (සී) පරිදි වාර්ෂික විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

3.5.2 **සැපයීම් හා සේවා**

(අ) නෙක්ෆා පරිගණක පද්ධතිය

ප්‍රාදේශීය සභාව විසින් කාර්යාල කටයුතු කළමණාකරණය කිරීම සඳහා 2013 ඔක්තෝබර් 03 දින පෞද්ගලික ආයතනයක් සමග ගිවිසුම්ගතව වරිපනම් බදු , විවිධ ආදායම්, ගිණුම් කටයුතු , තොග පාලනය සහ වීදි පහන් යන ක්ෂේත්‍ර කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීමට රු.1,637,000 ක් වැයකර තිබුණි. මෙම මෘදුකාංග පද්ධතිය මිලදීගැනීමේ මූලික අරමුණ ක්ෂේත්‍ර 05 ක දත්ත රැස්කිරීම හා කළමනාකරණ කටයුතු සිදුකිරීම වුවද සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ක්‍රියාත්මක කර තිබුනේ වරිපනම් ආදායම් කළමනාකරණය පමණි.

(ආ) ටයර් මිලදී ගැනීම

2017 වර්ෂයට සභාවේ වාහන සඳහා අවශ්‍ය ටයර් මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකර එකම ආයතනයකින් මිලදී ගෙන තිබුණි.

3.5.3 **කොන්ත්‍රාත් පරිපාලනය**

මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2012 ජනවාරි 05 දිනැති PED/PMD/Clari/11/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2012 හි වගන්ති අංක 3.1 ප්‍රකාරව ප්‍රජා පාදක සංවිධාන සඳහා ඍජු කොන්ත්‍රාත් පැවරීමේ දී දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නම් කරනු ලබන නියෝජිතයින් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක් මගින් සුදුසුකම් පරීක්ෂා කර සනාථ කිරීමෙන් තොරව ප්‍රජා පාදක සංවිධානවලට සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් පිරිනමා තිබුණි.

4. **පද්ධති හා පාලනය**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ආදායම් පරිපාලනය | (i) | වරිපනම් හා කඩකුලී තක්සේරු නොකිරීම. |
| | | (ii) | ඌන උපයෝජිත කඩ කාමර පැවතීම. |
| | | (iii) | වරිපනම් බදු ප්‍රතිශත සංශෝධනය නොකිරීම. |
| (ආ) | අයවැය පාලනය | (i) | අයවැය ප්‍රායෝගික තත්ත්වයන්ට අනුකූල නොවීම |
| | | (ii) | අවිධිමත් පරිදි වැය විෂයයන් අතර මුදල් මාරුකිරීම. |
| (ඇ) | වත්කම් කළමනාකරණය | (i) | තොග මිලදී ගැනීමේ හා නිකුත්කිරීමේදී ලේඛනවල ඇතුලත් නොකිරීම. |
| | | (ii) | භෞතිකව නොමැති වත්කම් ගිණුම් ගතවී තිබීම. |
| | | (iii) | වත්කම් වලට අදාල අයිතිය තහවුරු කිරිමට ඔප්පු හෝ පැවරුම් නියෝග නොතිබීම. |
| | | (iv) | ඉන්වෙන්ට්‍රි ලේඛන නොපැවැත්වීම. |
| (ඈ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | (i) | කසළ බදු හෝ ගාස්තු අය නොකිරීම. |
| | | (ii) | කසළ වෙන්කර ලබාදීමට ජනතාව දැනුවත් නොකිරීම. |
| | | (iii) | කසළ බැහැර කිරිම් වියදම් අධිකවීම. |